**වෘත්තීය අංශය** – කෘෂිකාර්මික

**වෘත්තීය නාමය/ රැකියාව** -
සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍ර ක්‍රියාකරු

**වෘත්තීය/රැකියා විස්තරය** –
අස්වනු නෙලීමේ යන්ත්‍රය ආරක්ෂිතව ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍ර ක්‍රියාකරු වගකිව යුතුය. මෙම වෘත්තිය පූර්ව ආරම්භක ක්‍රියා පටිපාටිය, අස්වනු නෙලීමේ ක්‍රියාපටිපාටිය, යන්ත්‍ර නවතා තැබීමේ ක්‍රියාපටිපාටිය සහ බහුල වශයෙන් අස්වනු නෙළන කාලය තුළ යන්ත්‍රය ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා එහි නඩත්තු කටයුතු පවත්වාගෙන යාම ආදී සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිපුණතා ආවරණය කරයි.

**වෘත්තීය/රැකියා රාජකාරි** –

- පූර්ව මෙහෙයුම් පරීක්ෂා සිදු කිරීම
- ආරක්ෂක ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම
- ක්ෂේත්‍ර තත්වයන් හඳුනා ගැනීම
- අස්වනු නෙළීමේ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම - අස්වනු නෙලීම
- සංයුක්ත අස්වනු නෙලීම පැටවීම, බෑම සහ ප්‍රවාහනය සිදු කිරීම
- නඩත්තු කටයුතු සිදු කිරීම

**මසකට අපේක්ෂිත ආදායම** -
කන්න (යල සහ මහ) වශයෙන් රැකියා අවස්ථා පවතින අතර එක් කන්නයකදී ක්‍රියාකරුවෙකුට රු .300,000.00 සිට 400,000.00 දක්වා උපයා ගත හැකිය (මසකට රු. 50,000.00 - 66,600.00)

**වැඩ පරිසරය** -
මෙය වැඩමුළු සහ / හෝ වැඩබිම්වල සිදුවිය හැකිය

**පවතින වෘත්තීය මාර්ග-**
වෘත්තීය සුදුසුකම් සහිතව අස්වනු උපකරණ කාර්මික ශිල්පී , කාර්මික ක්ෂේත්‍රයේ උපදේශක , අධීක්ෂක, සුපරීක්ෂක තනතුරු දක්වා සහ ඉහළ තනතුරු සඳහා ප්‍රවිෂ්ට විය හැකිය.

**අවශ්‍ය නිපුණතා / ගුණාංග සහ පුහුණුව** -
අවශ්‍ය නොවේ

**රැකියා අවස්ථා පවතින ප්‍රදේශ**
උදා: රජය /පුද්ගලික / ස්වයං

**පවතින පුහුණු මාර්ග** –
ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටම



**වෘත්තීය/රැකියාව සඳහා ප්‍රවේශ සුදුසුකම්** - කියවීමේ හා ලිවීමේ හැකියාව: සිංහල / දෙමළ

මූලික කුසලතා: දළ සටහන් කිරීමේ හැකියාව , ශාරීරික යෝග්‍යතාවය

**පවතින දේශීය රැකියා ගණන (පෙර වර්ෂයේ)** -
750 සිට 850 දක්වා

**රැකියා අවස්ථා පවතින කලාප හෝ රටවල්** -
වී වගා කරන ලද දිස්ත්‍රික්කවල අස්වනු නෙළීමට පෙර සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍ර ක්‍රියාකරු විසින් දැනට සිටින අස්වනු නෙලන යන්ත්‍ර අයිතිකරුවන් සමඟ සම්බන්ධ විය යුතුය. නෙලන යන්ත්‍ර ක්‍රියාකරුවන් සඳහා රැකියා අවස්ථා නිර්මාණය වන බැවින් යන්ත්‍ර ආනයන සමාගම්වලට නව යන්ත්‍ර සඳහා ක්‍රියාකරුවන් යොමු කළ හැකිය.

**රැකියාස්ථ පුහුණු අවශ්‍යතාවය** - අස්වනු නෙළන ස්ථානයක

**වෘත්තීය / රැකියා සම්බන්ධ ගැටළු නිරාකරණය සඳහා වෙබ් සබැඳි / යූ ටියුබ් / වීඩියෝ / ප්‍රවීණයන්**

www.tvec.gov.lk, www.youthjobs.lk කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සම්බන්ධ හා යන්ත්‍රෝපකරණ හැසිරවීම පිළිබඳ යූටියුබ් වීඩියෝ

**වැඩි විස්තර සඳහා**
කාර්යමාලාව.

- සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍ර ක්‍රියාකරු අස්වනු නෙළන්නන් සමඟ අදාල කාල පදනම මත ගිවිසුමක් අත්සන් කළ යුතු ය.
- යන්ත්‍ර ක්‍රියාකරු විසින් අස්වනු නෙළන යන්ත්‍ර හිමිකරුගේ පරිශ්‍රයට වාර්තා කළ යුතු අතර ගිවිසුමට අනුව වැඩ කළ යුතුය.

